# කළමනාකරණ කමිටු රැස්වීම

දිනය - 2023.07.10

වේලාව - ප.ව. 3.00

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)

මූලාසනය - ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

| | | |
|---|---|---|
| 1. ඩබ්ලිව් .එම්. දයාවතී මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 4. කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මයා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 5. කේ.ජී.එස්.ප්‍රසන්න මයා | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| 6. කේ.එන්.කේ.සිල්වා මිය | - | ආදායම් කොමසාරිස් (බ.ප) |
| 7. ටී.කේ.ආර්.දිලේශිකා මිය | - | ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු) |
| 8. පාලිත අබේවර්ධන මයා | - | ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය |
| 9. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා | - | අධ්‍යක්ෂ (අය වැය) |
| 10. ඩබ්ලිව්.ඒ.සී.එස්.ප්‍රියදර්ශනී මිය | - | අධ්‍යක්ෂ ( ආදායම්) |
| 11. එන්.එච්.සුමින්ද මයා | - | අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) |
| 12. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා | - | අධ්‍යක්ෂ (සැලසුම්) |
| 13. ආර්.පී ගුණවර්ධන මිය | - | අධ්‍යක්ෂ (ගොඩනැගිලි) |
| 14. ඒ.තලංගම මයා | - | මූලස්ථාන ඉංජිනේරු |
| 15. කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ කණිෂ්ඨ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා නව පත්වීම් ලබා දෙන ලද බහුකාර්ය සේවකයින් පත් කිරීම සම්බන්ධව | බහුකාර්ය සංවර්ධන සහායකයින් සඳහා පත්වීම් ලබා දීමේදී ඉංජිනේරු කාර්යාංශයේ තාක්ෂණික කටයුතු සම්බන්ධව පුහුණුවක් ලබා සිටි බහු කාර්ය සංවර්ධන සහායකයින් දෙදෙනාට ප්‍රවාහන අමාත්‍යාංශය වෙත පත්වීම් ලබා දී ඇත. නැවත වරක් ඔවුන් ඉංජිනේරු කාර්යාංශය වෙත ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර ප්‍රවාහන අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩුව සඳහා ඉංජිනේරු අංශයෙන් කාර්යාල කාර්ය සහයකයින් දෙදෙනෙක් ලබා දී ඔවුන් නැවත ඉංජිනේරු කාර්යාංශය වෙත ලබා ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රවාහන අමාත්‍යාංශයෙන් දන්වා ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) හා මූලස්ථාන ඉංජිනේරු විසින් අදහස් දක්වන ලදී.<br>ඒ අනුව කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද බහුකාර්ය පත්වීම් ලබා දීමේදී අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්යාල කාර්ය සහයක සේවය සඳහා පත්කරන ලද සේවකයින් වෙත අනිකුත් බහුකාර්ය සංවර්ධන සහායකයින් වඩා වරප්‍රසාදයක් ලැබී ඇති බවත් , ඔවුන්ගේ සේවය උපරිම ලෙස කාර්යාල කටයුතු සඳහා ලබා ගැනීම කෙරෙහි සැලකිලිමත් වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 02. | ආදායම් දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් සම්බන්ධව | ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ තව දුරටත් සිදු විය යුතු ඉදිකිරීම් කටයුතු සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් කරුණු විමසන ලදී.<br>ඒ අනුව වැසිකිලි අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ගලිය සම්බන්ධ ගැටළුවක් පවතින අතර එය භාරා සකස් කල යුතු බවත් , එය ගැඹුරට හැරීමේ කටයුතු සිදුකල යුතු අතර ජලය කාන්දුවන බැවින් ඒ සඳහා වැසි කාලය නිමවන තෙක් සිටීමේ අවශ්‍යතාව පිළිබඳ මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු දක්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |

ප්‍රදීප් ...රත්න
ප්‍ර... ...ධිර පළාත

| | | | |
|---|---|---|---|
| 03. | කාර්යාල වලින් බැහැර කරනු ලබන ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය ඉවත් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටා ඇති කාර්යාල වලින් බැහැර කරන ලදුව වාහන නවතා තැබීමට වෙන්කර ඇති P මහලෙහි ගොඩ ගැසී තිබුණු ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය , අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් මේවන විට ඉවත් කිරීමට කටයුතු කර ඇත.<br>එම ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය පරිසරයට හානියක් නොවන පරිදි බැහැර කළ යුතු බැවින් එම කටයුත්ත ක්ලීන් ටෙක් නම් පෞද්ගලික ආයතනයක් මගින් සිදුකරන අතර ඔවුන්ට ඒ සඳහා මුදලක් ගෙවීමට සිදුවන බව අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් දන්වා ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව එම අපද්‍රව්‍ය පරිසරයට හානියක් නොවන පරිදි ඉවත් කිරීමට සිදුවන බැවින් පළාත් පාලන ආයතන මගින් ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු නොකරන අතරම , පෞද්ගලික ආයතනයකට පළාත් සභාව මගින් මුදල් ගෙවීමක් සිදුකල නොහැකි බැවින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් පෞද්ගලික ආයතනය සම්බන්ධ කර ගනිමින් එම කටයුත්ත සිදුකර මාසය අවසානයේ දී අදාළ බිල්පත් ඉදිරිපත් කර පළාත් සභාවෙන් මුදල් ලබාගෙන එම ආයතනයට ගෙවීමේ ක්‍රමවේදයක් සකස් කර ගැනීමට කටයුතු කරන ලෙස අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට දන්වන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | කාර්ය සාධන තරඟාවලිය සඳහා ලබා දී තිබූ ප්‍රශ්නාවලිය ඇතුලත් Google Form ලබා දීමේදී අවසාන දිනය 2023.07.10 දිනය ලෙස දැනුම් දී තිබූ නමුත් ආයතන 1399 කින් ආයතන 260 ක පමණක් එය ඉදිරිපත් කර තිබූ බැවින් එම දිනය 2023.07.19 දින දක්වා දීර්ඝ කිරීමට කටයුතු කළ බවට හා ප්‍රශ්නාවලි සම්පූර්ණ කිරීමේදී පැවති ගැටළු මේ වන විට එම ආයතන දැනුවත් කර නිවැරදි කිරීමට පියවර ගනිමින් සිටින බවත් සහකාර ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එසේ කටයුතු කරන ලෙසත්, කාර්ය සාධන තරඟාවලියේ දී ජයග්‍රාහකයන් වෙනුවෙන් ලබා දෙන සහතික පත්‍ර නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවත් ප්‍රධාන ලේකම් විසින් කරුණු දක්වන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ අලුත් වැඩියා කටයුතු සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම් සම්බන්ධව සාකච්ඡා කල අතර ඒ අනුව පිවිසුම් දොරටුවල ඇති බිත්ති, විදුලි සෝපාන පිවිසුම් ස්ථාන හා ආලින්දයේ වර්ණ ගැන්වීමේ කටයුතු සිදුකල යුතුව ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තු සකස්කර ඇති බවත්, මීට අමතරව ආපන ශාලාවේ ගැලවී ඇති ටයිල් සවි කිරීමට හා ආපන ශාලාවේ වීදුරු සවිකර ඇති දොරවල් දෙකක බිඳී ගිය වීදුරු සවිකර දොරවල් සවි කිරීම හා අනිකුත් නඩත්තු කටයුතු රැසක් සිදු කිරීමට ඇස්තමේන්තුවක් සකස්කරමින් පවතින බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද මෙම වසරේ ගොඩනැගිලි නඩත්තු කටයුතු සඳහා මෙතෙක් ආයතනයක් වෙත පවරා නොමැති අතර පුවත් පත් දැන්වීම් මඟින් ආයතනයක් තෝරාගෙන ඇති බවත් ,ගිවිසුම් අත්සන්කර බැදුම්කර ලබා දීමට කටයුතු කරමින් පවතින බවටත් , මූලස්ථාන ඉංජිනේරු විසින් වැඩි දුරටත් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>තවද වගකීම් කාලය ඉකුත්වීමට පෙර පිලිස්සී ගිය විදුලි බුබුළු නැවත සපයා ගැනීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර ඒ සඳහා එම ආයතනයෙන් ලක්ෂ දහ හතක මුදලක් රඳවා තබාගෙන ඇති අතර වසර පහක් නිම වීමට පෙර එම විදුලි බුබුළු සපයා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>මූලස්ථාන ඉංජිනේරු |
| 06 | බස්නාහිර පළාත් ගොඩනැගිල්ල තුල පවතින සංචලන භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරිම | අධිකාරිවලට පවරා දී ඇති සංචලන භාණ්ඩ ක්‍රමවත්ව ඉන්වෙන්ට්‍රි ගත වී නොමැති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු දක්වන ලදී. රුපියල් මිලියන පන්සියක පමණ භාණ්ඩ ගිණුම් ගතකර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ නමුත් මෙවරද විගණන වාර්තාවට එය ඇතුලත් කර ඉදිරිපත් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් වැඩි දුරටත් කරුණු දක්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 07 | බස්නාහිර පළාත් ප්‍රධාන ශ්‍රවනාගාරයේ වායු සමීකරණ පද්ධතියේ පැවති ගැටළුව සම්බන්ධව | බස්නාහිර පළාත් ප්‍රධාන ශ්‍රවනාගාරයේ වායු සමීකරණ පද්ධතියේ පැවති ගැටළුව සම්බන්ධව වර්තමාන තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරන ලදී. එහි වායුසමීකරණ සඳහා යන්ත්‍ර දෙකක් සවි කර ඇති අතර එක් යන්ත්‍රයක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක බවත් අනිත් යන්ත්‍රයෙහි කම්ප්‍රෙෂර් තුනෙන් එක් කම්ප්‍රෙෂරයක් පමණක් ක්‍රියා කරන බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු දක්වන ලදී.එය පිළිසකර කිරිමට ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා සුදුසු සැපයුම් කරුවකු සපයා ගැනීමට කටයුතු කලද ඒ සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවිය. වායු සමීකරණය සඳහා සවිකර ඇති යන්ත්‍රය පිළිසකර කිරිමට අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීමේ ගැටළුවක් පවතින හෙයින් එය පිළිසකර කිරීමේ හැකියාවත් නොමැති බවත් , ශ්‍රවනාගාරයේ පවත්වන වැඩසටහන් සඳහා දවසේ වැඩි කාලයක් වායු සමීකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් පවතින බවට වැඩි දුරටත් මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු දක්වන ලදී.<br>ඒ අනුව ශ්‍රවනාගාරයේදී කලාප කාර්යාලවල විශ්‍රාම වැටුප් ප්‍රමාද වීම පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා පිරිස 250 ක් පමණ සහභාගී වන බවටත් එය ප.ව.4.00 දක්වා පමණ කාලයක් පැවැත්වෙන බවටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ මූල්‍ය) |
| 08 | කාර්යාල ප්‍රවාහන පහසුකම් සපයන ලද බස්රථ කාර්යාලයෙන් පිටත්වීම සම්බන්ධව | බස්නාහිර පළාත් සහ ගොඩනැගිලි සංකීර්ණයෙහි සියලුම අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතනවල සෙවයේ නියුතු නිලධාරීන්ගේ ගමනා ගමන් පහසුව සඳහා යොදවා ඇති බස් රථ කාර්යාල කටයුතු නිමවීමෙන් පසු ප.ව.4.30ට පිටත්වීමට කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>එමෙන්ම කාර්යාල බස්රථවල ගමන් ගන්නා නිලධාරීන් කාර්යාල කටයුතු සඳහා ප.ව.4.15 වන තෙක් කාර්යාලයේ රැදී සිටිය යුතු බවත් , ඊට පෙර පිටත් නොවන ලෙසත් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් මෙන්ම දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතන ප්‍රධානීන් ලිඛිතව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අවධාරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 09. | නිලධාරීන් ආපන ශාලාවේ නිකරුණේ රැඳී සිටීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයෙහි අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල සේවය කරන ඇතැම් නිලධාරීන් ආපන ශාලාව භාවිතා කිරීමේදී නිකරුණේ දිගු කාලයක් ආපන ශාලාවේ කාලය ගතකරන බව දක්නට ලැබී ඇති බවත් නැවත වරක් ඒ සම්බන්ධව සියලුම අමාත්‍යාංශ ලේකම්වරු හා අනිකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එමෙන්ම රියදුරන් නිතරම ආපන ශාලාවේ කාලය ගත කරන බව දක්නට ලැබෙන අතර ඒ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | බස්නාහිර පළාත් සභාවේ තොරතුරු තාක්ෂණ පද්ධතීන් නඩත්තු කිරීම හා සේවා පවත්වාගෙන යාමට අදාළ ප්‍රසම්පාදන කටයුතු ඉංජිනේරු අංශයට පැවරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවේ සහා සංකීර්ණය ඇතුලත් නව බහු මහල් කාර්යාල ගොඩනැගිල්ලේ තොරතුරු තාක්ෂණ පද්ධතීන් නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේ කටයුතු ඉංජිනේරු අංශයට පැවරීම සම්බන්ධයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් යෝජනාවක් ඉදිරිපත් කරන ලදී.<br><br>ඒ අනුව එය Network and server room , Microsoft Software License සහ Antivirus Software ලෙස කොටස් තුනකින් සමන්විත වන අතර මේ සඳහා ටෙන්ඩර් කැඳවීමේ කටයුතු පාලන අංශය මඟින් සිදු කරන ලදී.නමුත් මූල්‍ය චක්‍රලේඛ 09/2019 දරන චක්‍රලේඛය අනුව මීට අදාළ ඉන්වෙන්ට්‍රි ගත භාණ්ඩ සියල්ල ඉංජිනේරු අංශය භාරයේ පවතී.ඒ අනුව මෙම කොටස් තුනෙන් දෙකක් 2023.11.01 දිනෙන් ද, එකක් 2025.11.01 දිනෙන්ද ගිවිසුම් කල් ඉකුත්වන අතර ඉන්පසු ඒ සඳහා ටෙන්ඩර් කැඳවීම හා අනිකුත් කටයුතු ඉංජිනේරු අංශය මඟින් සිදු කිරීම සුදුසු බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් වැඩි දුරටත් පැහැදිලි කරන ලදී.<br><br>ඒ අනුව එසේ සිදු කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අනුමැතිය ලබා දුන් අතර , ඒ පිළිබඳ තොරතුරු ඉංජිනේරු කාර්යාංශය වෙත ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන /ඉංජිනේරු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 11. | පෞද්ගලික කාර්යන් ඉටුකර ගැනීම සඳහා පැමිණෙන මහජනතාව වෙනුවෙන් පිවිසුම් ආලින්දයේ ආසන යෙදීම සම්බන්ධව | බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ ඇතැම් කාර්යයන් බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරීමත් සමඟ මහජන දිනය වන සඳුදා දිනයන් මෙන්ම අනිකුත් දින වලදී සේවා ලබා ගැනීමට පැමිණෙන මහජනතාව ඉහළ ගොස් ඇති බැවින් මේ වන විට සලසා ඇති ආසන පහසුකම් ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වී ඇත.<br>ඒ අනුව මහජනතාව රැඳී සිටින පිවිසුම් ආලින්දයෙහි දැනට යොදා ඇති ප්ලාස්ටික් පුටු ඉවත්කර අසුන් ගැනීමට පහසු ආසන සකස් කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා උපදෙස් ලබා දී ඇති බැවින් ඒ සඳහා කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ ඉංජිනේරු) |
| 12. | විදුලි විසන්ධි වීම් වලදී ජෙනරේටර් භාවිතය පිළිබඳ දැනුවත් කිරීම | විදුලිය විසන්ධි වී නැවත විදුලිය ලැබෙන අවස්ථා වලදී ජෙනරේටර් ක්‍රියාත්මක කිරිම සඳහා එක් සේවකයෙකු පමණක් සේවයේ නියුතු වේ.විදුලි විසන්ධි වූ අවස්ථාවක නැවත වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් විමසා සිටි අතර ඒ අනුව පහත මහලේ පාලන මැදිරියේ යන්ත්‍ර 17 ක් හා තට්ටු 11 ක යන්ත්‍ර 33 ක් ලෙස යන්ත්‍ර 50 ක්‍රියා කිරීම එක් සේවකයෙකු පමණක් සිදු කරන බැවින් විනාඩි විස්සක පමණ කාලයක් ගතවන බවට මූලස්ථාන ඉංජිනේරු විසින් කරුණු ඉදිරිපත් කරන ලදී. තවද එම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමේදී එම යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය පිළිබඳ ක්‍රියා කරුවන් තුල මනා දැනුමක් තිබිය යුතු බව මූලස්ථාන ඉංජිනේරු විසින් වැඩි දුරටත් දන්වන ලදී.<br>එක් අයකුට පමණක් කාර්යක්ෂමව එම කටයුත්ත සිදුකළ නොහැකි බැවින් සෑම කාර්යක් සම්බන්ධවම ප්‍රවීණයන්ට අමතරව පසුපෙළ කණ්ඩායමක් පුහුණු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ පැහැදිලි කරමින් ඉංජිනේරු අංශයේ දැනට සේවයේ නියුතු කාර්යාල කාර්ය සහයකයින් කිහිප දෙනෙකුට එම යන්ත්‍ර ක්‍රියාකාරීත්වය පිළිබඳ පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු / පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 13. | වැසිකිලිවල දොරවල් ගැලවී තිබීමේ ගැටළුව සම්බන්ධව | 6 වන මහලෙහි වැසිකිලිවල දොරවල් ගැලවී තිබීමේ ගැටළුවක් පවතින බැවින් ඒවා පිළිසකර ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ මුල්‍ය අංශයේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු වෙනුවෙන් තවම ගිවිසුම් අත්සන් කර නොමැති බැවින් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එම දොරවල් වල ගැලවී ඇති සරනේරු සවිකර සියල්ල පිළිසකර කිරීමට කටයුතු කරන බවත් මූලස්ථාන ඉංජිනේරු විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 14. | බඳු නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධව | ආදායම් දෙපාර්තමේන්තුව වෙත බදු නිලධාරීන් බඳවා ගැනීමට පිරිස් පුහුණු අංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා පවතින අවශ්‍යතාවය පිළිබඳ ආදායම් කොමසාරිස් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව බදු නිලධාරීන් බඳවා ගැනීම සඳහා රජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත් රේඛීය අමාත්‍යාංශවලට නිලධාරීන් බඳවා ගැනීමට අවසර ලබා දීමෙන් අනතුරුව පළාත් සභා සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අවසර ලබා දෙන බවට දන්වා ඇති බැවින් ඉදිරියේදී එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |
| 15. | පුහුණු වැඩසටහන් සම්බන්ධව | නව පත්වීම් ලබා දුන් සංවර්ධන නිලධාරීන් වෙත සේවා ආරම්භක පුහුණුව ලබා දීමට කටයුතු කළ අතර පරිගණක පුහුණුවක් ලබා දෙන ලෙස ඔවුන්ගෙන් ඉල්ලීමක් ඉදිරිපත්ව ඇති බැවින් පරිගණක පුහුණුවක් ලබා දීමේ අවශ්‍යතාවය හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් පුහුණු) විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br>තවද අලුතින් පත්වීම් ලබා දුන් බහු කාර්ය සංවර්ධන සහයකයින් වෙනුවෙන්ද එක් දින පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඔවුන්ගේ ආකල්ප , ඇඳුම් පැළඳුම් හා රාජකාරී වගකීම් සම්බන්ධව එහිදී අවධානය යොමු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 16. | සේවා අවශ්‍යතාව සඳහා වෛද්‍ය සහතික ලබා ගැනිම සම්බන්ධව | නව පත්වීම් ලබා ගන්නා සියලුම නිලධාරීන් සඳහා වෛද්‍ය සහතික ලබා ගැනීමට ලබා දෙන රාජකාරී නිවාඩු දින දෙකක් පමණක් ලබා දීමට කටයුතු කරන ලෙසත් ඊට අමතරව යම් හේතුවක් නිසා වෛද්‍ය උපදෙස් මත අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම් ඊට අදාළ වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමෙන් පසුව එය ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 17. | නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ පුහුණුවක් ලබා දීම සම්බන්ධව | ඉංජිනේරු අංශය මඟින් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.ඒ අනුව නැවත වරක් ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එම පුහුණු වැඩසටහන් පැවැත්විමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දුන් අතර බාහිර සම්පත් දායකයින් ඒ සඳහා යොදා ගැනීමේදී ඔවුන්ට විශාල මුදලක් ගෙවීමට සිදුවන බැවින් ඒ සඳහා හැකියාවක් ඇති නිලධාරීන් සම්පත් දායකයින් ලෙස යොදා ගනිමින් එම පුහුණු වැඩසටහන පැවැත්වීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය/ පිරිස් පුහුණු) |
| 18 | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයෙන් පිටත ඇති වෙනත් ආයතන වලට අයත් ගොඩනැගිලිවල කුලී පදනම මත පවත්වාගෙන යන කාර්යාල සියල්ල බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රය තුල ස්ථාපිත කිරිම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමා විසින් උපදෙස් ලබා දී ඇති බවට ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී.<br>ඒ අනුව පළාත් සභා ගොඩනැගිලේ පවතින අමාත්‍යාංශවල ප්‍රයෝජනවත් ලෙස යොදාගත හැකි ඉඩකඩ පවතින බවත්, එම පවතින ඉඩකඩ ඵලදායී ලෙස යොදා ගැනීමේ ඇති හැකියාව සම්බන්ධවත් සාකච්ඡා කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු/ සැලසුම්) |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත